## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදල- 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ලැබියයුතු ගිණුම්

වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථ සාධක අරමුදලේ මුදල් ආයෝජනය කළ මූල්‍ය ආයතනයක් විසින් අදාල ආයෝජන ආදායමින් නියමිත ප්‍රමාණය ඉක්මවා රු.191,095ක් රඳවා ගැනීමේ බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. එම වැඩිපුර ප්‍රේෂණය කළ මුදලින් රු.61,789 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 2. මූල්‍ය සමාලෝචනය

#### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය ආදායම් බද්දට පෙර රු.6,917,457ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.5,038,341ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු.1,879,116ක් විය. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී ආදායම රු.1,818,142කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සේවක අර්ථසාධක අරමුදල ස්ථිර සේවකයින්ගේ මාසික ඉපයීම් වලින් අයකරන සියයට 10ක දායක මුදල හා විශ්වවිද්‍යාලය මගින් එම ඉපයීම් මත ගෙවනු ලබන සියයට 15ක දායක මුදලින් සමන්විත වේ. එම මුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම හා සේවක ණය ලබාදීමට කටයුතු කරනු ලබයි. අරමුදලේ දායක ගිණුම්වලට බැර කරන ලද පොළිය සමාලෝචිත වර්ෂයේ රු.6,142,288ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.4,526,821ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම සියයට 35.6ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයෙ දී කල්පිරී තිබූ එකතුව රු.72,900,000ක් වූ ආයෝජන නැවත ආයෝජනය ප්‍රමාද කිරීම හේතුවෙන් අරමුදලට රු.643,606ක පොළී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට විවිධ හේතූන් මත අදාළ ප්‍රතිලාභීන් 08 දෙනෙකු වෙත රු.2,441,346 ක් ගෙවීම් ප්‍රමාද කර තිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 05 දින විශ්‍රාමගත් නිලධාරිණියකට ගෙවිය යුතු රු.2,186,834ක් වූ අර්ථසාධක අරමුදල් ශේෂය පනතේ 28(3) වගන්තිය ප්‍රකාරව මාස 03ක් ඇතුළත ගෙවිය යුතු වුවත්, 2013 අප්‍රේල් දක්වා ගෙවා නොතිබුණි. පාලක සභාව විසින් පනවන ලද නියෝග අංක 06 අනුව ආදායකයා විශ්‍රාමගිය විට ගිණුම වසා දැමිය යුතු වුවත්, එසේ කර නොතිබුණි.

(ඇ) පාලක සභාව විසින් පනවන ලද නියෝග අංක 09ට අනුව, සෑම වර්ෂයක් අවසානයේම පාලක සභාව විසින් මුදල් විෂයභාර අමාත්‍යවරයාගෙන් විමසා, පනතේ 28(3) වගන්තිය අනුව වැල් පොලියක් නියමකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා අදාල අනුමැතිය ලබා නොතිබුණි.

4. **පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට යොමු කරන ලදී. එම ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු බව නිරීක්ෂණය කෙරේ.